<u>**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**</u>

<u>**තාවකාලික පදනම මත වැඩසටහන් සහකාරවරුන් බඳවා ගැනීම - (මෙට්‍රොපොලිටන් මණ්ඩපය)**</u>

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මෙට්‍රොපොලිටන් මණ්ඩපයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර ස්ථිර මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම් සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘති පත්‍රයට අනුව පිළියෙල කල අයදුම්පත්, උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් , සහතික කල අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතික සමඟ **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - **2025.01.17**

<u>පොදු කොන්දේසි</u>

**01**. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

**02**. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව, ලිඛිත පරීක්ෂණයේ සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

**03**. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**04**. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

**05**. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන්(**https://kdu.ac.lk**)භාගත කර ගත හැකි ආකෘති පත්‍රය මඟින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්.වී.කේ.සී.සන්දනායක
වැඩබලන ලේඛකාධිකාරී

## වැඩසටහන් සහකාර (තාවකාලික)

**අවම සුදුසුකම්**

**01.** **i.** සිංහල භාෂාව / දෙමළ භාෂාව
**ii.** ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය
**iii.** ගණිතය
යන විෂයන්ගෙන් විෂයන් 03 ටම සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදි අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

සහ

**02.** එක් වරකදී අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සියළුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

**03.** පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදවුම් භාවිතය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හා ඒ පිළිබඳ වසර 02 ක පළපුරුද්ද.

(ආ) අලෙවිකරණ කලමනාකරණය පිළිබද පාඨමාලාවක් හදාරා තිබීම හා ඒ පිළිබද පළපුරුද්ද.

**වයස:** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු.18ට නොඅඩු සහ වයස අවු.30 ට නොවැඩි විය යුතුය.

**මාසික වැටුප**

රු. 37,970/- ක ස්ථිර මාසික දීමනාව සහ රජයේ අනුමත අනෙකුත් දීමනා

**අනෙකුත් දීමනා**

සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම සහ අනෙකුත් දීමනා.